# PRESS RELEASE

**මාධ්‍ය නිවේදනය**
**பத்திரிகை அறிக்கை**

J.R Jayewardane Center, No. 191, Dharmapala mawatha,
Colombo 07
+94 112196618
welfarebenefitboard2016@gmail.com

**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය**
**நலன்புரி நன்மைகள் சபை**
**WELFARE BENEFITS BOARD**

ජනමාධ්‍ය නිවේදන අංක - 2026.01.27 Com-01

**<u>අස්වැසුම පළමු අදියර සහ දෙවන අදියර ජනවාරි මස දීමනාව සහ වැඩිහිටි දීමනාව ගිණුම්ගත කිරීම සම්බන්ධවයි.</u>**

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් අස්වැසුම පළමු අදියර සහ දෙවන අදියරට සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන්ගේ ජනවාරි මස දීමනාව මෙන්ම එම අදියර දෙකටම අදාල ජනවාරි මස වැඩිහිටි දීමනාවද , 2026 ජනවාරි මස 28 දින එම ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම් වෙත බැර කිරීමට කටයුතු කරනු ලැබේ.

ඒ අනුව අස්වැසුම පළමු අදියරට අදාළව රු. 11,234,713,750.00ක **(එකොළොස් බිලියන දෙසිය තිස් හතර මිලියන හත්සියදහතුන් දහස් හත්සිය පනහක)** මුදලක් ප්‍රතිලාභී පවුල් 1,415,584ක් **(දාහතර ලක්ෂ පහළොස් දහස් පන්සිය අසූ හතරක්)** අතරේ බෙදා හරිමින් ඔවුන්ගේ බැංකු ගිණුම් වෙත බැර කිරීමට නියමිතය. අස්වැසුම පළමු අදියරට අදාළ ජනවාරි මස වැඩිහිටි දීමනාව ලෙස රු. 3,092,200,000.00 **(තුන් බිලියන අනූදෙමිලියන දෙසීය දහසක)** මුදලක් ප්‍රතිලාභීන් 618,440 (හයලක්ෂ දහඅටදහස් හාරසිය හතලිහ) ක් අතරේ බෙදාහරිමින් ඔවුන්ගේ අස්වැසුම බැංකු ගිණුමට බැර කිරීමට නියමිතය.

එමෙන්ම අස්වැසුම දෙවන අදියරට අදාළ ජනවාරි මස දීමනාව ලෙස රු.2,235,137,500.00 (දෙමිලියන **දෙසියතිස්පස් මිලියන එකසිය තිස් හත්දහස් පන්සියයක)** මුදලක් ප්‍රතිලාභී පවුල් 248,454 (දෙලක්ෂ **හතලිස් අටදහස් හාරසිය පනස්හතර)** ක් අතරේ බෙදා හරිමින් ඔවුන්ගේ බැංකු ගිණුම් වෙත බැර කිරීමට නියමිතය. අස්වැසුම දෙවන අදියරට අදාළ ජනවාරි මස වැඩිහිටි දීමනාව ලෙස රු. 340,915,000.00 **(තුන් බිලියන හතලිස් මිලියන නවසිය පහළොස් දහසක)** මුදලක් ප්‍රතිලාභීන් 68,183 (හැට අටදහස් **එකසිය අසූතුනයි)** ක් අතරේ බෙදාහරිමින් ඔවුන්ගේ අසවැසුම ගිණුමට බැර කිරීමට නියමිතය.

නිමල් කොටවලගෙදර
කොමසාරිස් / සභාපති



Scanned with CamScanner